# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2336/67 - 2023 ජුනි මස 16 වැනි සිකුරාදා - 2023.06.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක : 14

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

18 වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 18 වැනි වගන්තිය මගින් වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය නලින් ප්‍රනාන්දු වන මම, 2022 ජූලි මස 08 වන දින අංක 2287/37 දරන ලංකාණ්ඩුවේ *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් නිශ්චිත භාණ්ඩ වශයෙන් ප්‍රකාශ කරන ලද "ලික්විෆයිඩ් පෙට්‍රෝලියම් ගෑස්" යන භාණ්ඩය මෙම නියමය මගින් නිශ්චිත භාණ්ඩවල බලපෑමෙන් නිදහස් කරමි.

නලින් ප්‍රනාන්දු,
වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය.

2023 ජුනි මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියෝග අංක : 15

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත (සංශෝධිත)**

18 වන වගන්තිය යටතේ නියෝගය

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය නලින් ප්‍රනාන්දු වන මම, පහත දැක්වෙන භාණ්ඩ ප්‍රජාවගේ ජීවිතයට අත්‍යාවශ්‍ය වන බව මගේ මතය වන හෙයින්, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විමසීමෙන් පසු එකී භාණ්ඩ 'නිශ්චිත භාණ්ඩ' වශයෙන් 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ (සංශෝධිත) 18 වැනි වගන්තිය යටතේ 2023 ජුනි මස 16 වන දින මධ්‍යම රාත්‍රියේ සිට බලපවත්වන පරිදි මෙයින් නියම කරමි.

*නිශ්චිත භාණ්ඩ ලැයිස්තුව :*

1. තිරිඟු පිටි

**නලින් ප්‍රනාන්දු,**
වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය.

2023 ජුනි මස 16 වැනි දින,
කොළඹ දී ය.

EOG 06 - 0127

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.